

Not For Sale -CMSP

## ආදර පුංචි දූ පුතුන්ට සෙනෙහසින්.....



ආදරණීය දුවේ, පුතේ,

ඔයා මේ ලෝකෙ එළිය දුටුදා පටන් ආදර අම්මගේ තුරුලේ උණුසුම විඳිමින් වසර හතරකට ආසන්න කාලයක් ගත කළා. එදා ඉඳන් ඔයාගෙ දුකේදි, සැපේදි ඔයාට හිටියෙ අම්මයි, තාත්තයි, පවුලේ අයයි විතරයි.

මේ වසරේ ඔයා ගොඩක් දේවල් ඉගෙන ගන්න පෙර පාසලට යනවා. ඉතිං දැන් ඔයාගෙ දෙවැනි අම්මා වෙන්නෙ පෙර පාසලේ ආදරණීය ගුරුතුමියයි. පුංචි ඔයාට උගන්වන දේවල් හරියටම උගන්වන්න ඕන විදිය ගුරුතුමියට කියල දෙන්න "දක්ෂිණ සිඟිති සර" නමින් ක්‍රියාකාරකම් අත්පොතක් නිර්මාණය කළේ පුංචි දුව පුතා මේ ලෝකෙ අනාගත උරුමකරුවන් වන නිසාවෙන්මයි. පුංචි ඔයාලගෙ දක්ෂතා හා කුසලතා තවදුරටත් වර්ධනය කරන්න මේ පොත මහඟු අත්වැලක් වන බව මා විශ්වාස කරනවා.

හොඳට ඉගෙන ගෙන කවදාහරි ජීවිතේ ජය අරගෙන තමා මෙලොවට බිහි කරපු අම්මාට, හොඳින් රැක බලා ග[...] තාත්තාට කළගුණ සළකනවා දකින එක තමයි මගේ ලොකුම සතුට. පුංචි ඔයාලා හැමෝම ඒ වෙනුවෙන් කැපවෙන බව [...] විශ්වාසයි. මෙම පොතෙන් ලබන දැනුම තුළින් අධ්‍යාපනයේ නිම්වළලු පුළුල් කරන්නට පුංචි ඔයාලට ධෛර්යය හා ශක්[...] ලැබේවා යි ලෙන්ගතුව හා ආදරයෙන් ප්‍රාර්ථනා කරමි.

**ෂාන් විජයලාල් ද සිල්වා**
ප්‍රධාන අමාත්‍ය- දකුණු පළාත

Not For Sale - CMSP

## ක්‍රියාකාරකම් අත්පොත සඳහා දායකත්වය

### උපදෙස් හා මග පෙන්වීම

**කුලසිංහ වීරසේකර මහතා**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
(මුල් ළමාවිය සහ විශේෂ අධ්‍යාපන)
දකුණු පළාත් මුල් ළමා විය සංවර්ධන කමිටුවේ ලේකම්

### අධීක්ෂණය හා මෙහෙයවීම

**ඩබ්. එච්. දයාපාල මහතා**
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය පෞද්ගලික ලේකම්

### සම්බන්ධීකරණය

**මහින්ද පී. ලියනගේ මහතා**
දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය පෞද්ගලික සහකාර[...]

### සංස්කාරක මණ්ඩලය (නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිළධාරීන්)

- **ධම්මිකා ජී.ඩබ්. සහබන්දු මහත්මිය**
  දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- **කේ.එච්. ඉන්ද්‍රා මාලනී මහත්මිය**
  කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - ගාල්ල
- **ආර්.ජී. චම්පා ගයාමලී මහත්මිය**
  කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - බද්දේගම
- **චන්ද්‍රානි ද සිල්වා මහත්මිය**
  කලාප අධ්‍යාපන කාර්යාලය - ගාල්ල
- **දයානි රුවන් පතිරණ මහත්මිය**
  දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- **ඩී. ලේඛා චාන්දනී මහත්මිය**
  කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - අම්බලන්ගොඩ
- **ඩබ්. ඉනෝකා ප්‍රේමසිංහ මහත්මිය**
  කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - හබරාදුව
- **ඩී. තමරා බටුවන්තුඩාව මහත්මිය**
  කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - ගාල්ල
- **ජී. සුජීවා දමයන්ති මහත්මිය - පරිපාලන නිලධා[...]**
  දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය - ලබුදු[...]

### පරිගණක සිතුවම් නිර්මාණය

- **සනත් ධර්මබන්දු මහතා**
  විදුහල්පති,
  ගා/කන්නංගර මහා විද්‍යාලය, ගාල්ල

### පරිගණක මෙහෙයුම්

- **විහංග නයනජිත් මහතා**



දකුණු පළාත් ධජය



දකුණු පළාත් පුෂ්පය (හීන් බෝවිටියා මල)

දකුණෙන් විශ්වයට පා නඟන්නට පුංචි ඔබට මහඟු අත්වැලක්...



# දක්ෂිණ සිඟිති සර

## අවු : 4-5 අතර දරුවන් සඳහා

# ක්‍රියාකාරකම් අත්පොත

Not For Sale - CMSP

**සංකල්පය**

**දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය**
**ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා**

**මෙහෙයවීම හා සම්බන්ධීකරණය**

**දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,**
6 වන මහල, "දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.

☎ 091-2234705 ෆැක්ස් 091-2223054 Email shanvijayalal@gmail.com
091-2233522 091-2234455 Web https://www.cm.sp.gov.lk

**දකුණු පළාත් සංවර්ධන අධිකාරිය**
බාලදක්ෂ මාවත, කොටුව, ගාල්ල.
☎ 091-2234332

**සම්පත් දායකත්වය**

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය ඒකකය**
ඉහළ ඩික්සන් පාර, ගාල්ල.
☎ 091-2234234
091-2234896

# 01 නිදහස් කුරුටුගෑම්

**ඉගෙනුම් ඵල**

- හසුරු කුසලතා සංවර්ධනය වේ.
- නිදහස් චින්තනයට අවස්ථාව උදා වේ.

**ගුරුතුමියට උපදෙස්**

- පැස්ටල් පාට දී දරුවන්ට නිදහසේ කුරුටු චිත්‍රයක් ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- කුරුටු චිත්‍රය පිළිබඳ දරුවාගෙන් තොරතුරු විමසන්න.
- අදාල හැඩතල මතු කරගන්න.
- එම මතුකරගත් අර්ථ පහත, දිනය සමග සටහන් කරන්න.
- මෙම කුරුටු චිත්‍රය මසකට වරක් පෙන්වමින් දරුවා පවසන දේ පහත පරිදි දිනය සමග සටහන් කරන්න.

| මාසය | නිරීක්ෂණය කළ දිනය | සටහන් | ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

Not For Sale - CMSP

# දුවේ, පුතේ පිටුව පුරා කුරුටු ගාමු.

කුරුටු චිත්‍රය

Not For Sale - CMSP

..........................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

## 02 කැමති දෙයක් අඳිමු.

Not For Sale - CMSP

..................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# දුවේ, පුතේ දැන් අපි ඉරි අඳිමු.

Not For Sale - CMSP


.............................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

## 03 ඉරීම -සීයාට රැවුලක් හදමු.

**ඉගෙනුම් ඵල**

- සියුම් චාලක කුසලතා සංවර්ධනය වේ.
- මනස, ඇස, අත සමායෝජනය වේ.




Not For Sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- ඇඳින ලද සීයාට රැවුලක් හදන්න. ඒ සඳහා සව් කඩදාසි, පත්තර කොළ භාවිතා කරන්න
- දරුවාට දිග පටි නිදහසේ ඉරීමට අවස්ථාව දෙන්න.
- රැවුලක් ලෙස ඇලවීමට උදව් කරන්න.
- තව දුරටත් කොළ ඉරීමට අවස්ථාව ලබා දෙන්න. (පළල, හීන් පටි ලෙස)

# සීයාට රැවුලක් සාදා අලවමු.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 04 කැපීම - වෙසක් කූඩුවට රැලි අලවමු.

**ඉගෙනුම් ඵල**

- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- චිත්තවේග සංවර්ධනය වේ.



Not For Sale - OMSP

## ගුරුතුමියට උපදෙස්

- මේ සඳහා කතුර, ගම්, පාට සවි කොළ, පාට A4 ආදිය සපයන්න.
- කතුර භාවිතා කර කොළ පටි කැපීමට අවස්ථාව ලබා දෙන්න.
- කැපූ කොළ පටි රැලි සේ ඇලවීමට උපදෙස් දෙන්න.
- උදව් අවශ්‍ය දරුවන්ට උදව් කරන්න.

## අපි දැන් වෙසක් කූඩුවට රැලි අලවමු.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 05 කැපීම - කතුරෙන් ඉර දිගේ කපමු.

## ඉගෙනුම් ඵල

- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- චිත්තාවේග සංවර්ධනය වේ.
- කතුර භාවිතා කිරීමේ කුසලතා ලබයි.
- මානසික සංයමය වර්ධනය වේ. (ඉවසීම පුරුදු පුහුණු වේ.)



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- කතුර ලබා දෙන්න.
- ඉහත රූපය පරිදි වෙනත් කොළයක ඇඳ මුලින් ලොකු රැලිවල සිට, පොඩි රැලි දක්වා ඉර දිගේ කැපීමට අවස්ථාව ලබා දෙන්න.
- අලවන්න උපදෙස් ලබා දෙන්න.

# කතුරෙන් ඉර දිගේ කපා අලවමු.

Not For Sale - CMSP

.....................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 06 කැමති අඹ ගෙඩිය ඇඳ පාට කිරීම.

## ඉගෙනුම් ඵල

- විවිධ අඹ වර්ග හඳුනා ගනී.
- ස්වාධීනව අඹ ගෙඩියක් ඇඳීමේ කුසලතාවය වර්ධනය වේ.
- සීමාවක් තුළ පාට කිරීමේ කුසලතාවය දියුණු වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- රූපයේ ඇති විවිධ අඹ වර්ග පිළිබඳව දරුවන් සමග සාකච්ඡා කරන්න. (අඹවල රසය, ගුණය, හැඩ, වර්ණ පිළිබඳව)
- දරුවා කැමති අඹ ගෙඩිය දරුවාට ඇඳීමට සහ ඉහත රූප ආදර්ශයට ගෙන කැමති ආකාරයකට පාට කිරීමට උපදෙස් ලබා දෙන්න.
- දරුවන් කැමති පළතුරු වර්ග (දරුවන් හඳුනන) පින්තූර 03 සහ අඹ ගෙඩියක පින්තූර ලබා දී දරුවාට ඒ අතරින් අඹ ගෙඩිය හඳුනා ගත හැකිදැයි සොයා බලන්න.

# අපි දැන් කැමති අඹ ගෙඩිය ඇඳ පාට කරමු.


Not For Sale - CMSP

.......................................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 07 ගුලි කර ඇඹීම.

## ඉගෙනුම් ඵල

- දරුවාට අළුත් නිර්මාණ කිරීමේ අවස්ථාවක් උදාවෙයි
- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- අත්ලේ තිබෙන සංවේදී ස්ථාන (නිල) ඉතා හොඳින් ස්පර්ශ වීම නිසා කායික සමබරතාවය, චිත්තවේගී වර්ධනය වේ.
- නව නිර්මාණ බිහි කිරීමේ කුසලතාවය වර්ධනය වේ.
- චිත්ත ඒකාග්‍රතාවයක් ඇති වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- පිටි වලින් සාදාගන්නා ක්ලේ මිශ්‍රණය සෑම දරුවෙකුටම සාදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය ද්‍රව්‍ය පාන් පිටි ග්‍රෑම් 250 ක් පමණ , ලුනු කුඩු, පොල් තෙල්
- අත් දෙකම භාවිතා කර, ගුලි කර මිශ්‍රණය සෑදීමට උපදෙස් දෙන්න. මිශ්‍රණය වර්ණ ගැන්වීමට පරිසරයෙන් ලබාගත හැකි වර්ග තෝරා ගන්න. (බීට් ඉස්ම, නිවිති ඇට, පොකුරු වදමල් යුෂ වැනි) කෘතිම වර්ණක යොදා ගැනීමෙන් වළකින්න.
- මෙසේ සාදා ගත් ක්ලේ ගුලි කර **වෙනත් කඩදාසියක** මාලය ඇලවීමට උපදෙස් දෙන්න.
- <u>තවදුරටත් ඉගෙනුම</u>

  ක්ලේ භාවිතයෙන් බෝල සකස් කර කුරුල්ලන් සෑදීම, ඉරටුවල ඇමිණීම වැනි ක්‍රියාකාරකම්වල යොදවන්න.



# 08 කුරුල්ලන්ට කූඩුවක් හදමු.

**ඉගෙනුම් ඵල**

- පරිසරය පිළිබඳ අවබෝධය ලබා ගනී.
- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- ඇස, අත සමායෝජනය වේ.
- පරිසර ගවේෂණයට හුරු වේ.









**ගුරුතුමියට උපදෙස්**

- නිවසින් පොල් කොහු රැගෙන ඒමට යොමු කරන්න.
- සුදුසු වෙනත් කඩදාසියක් ගෙන වියළි කෝටු අලවා උඩට පොල් කොහු අලවා කූඩුව සකස් කර ගැනීමට උපදෙස් දෙන්න.

# 09 ටයරයක් හැඩ කරමු.

## ඉගෙනුම් ඵල

- දරුවාට අළුත් නිර්මාණ කිරීමේ අවස්ථාවක් උදාවෙයි
- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- චිත්ත ඒකාග්‍රතාවය ප්‍රගුණ වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- ක්‍රේප් කොළ/ සව් කොළ ගුලි කිරීමට දරුවන්ට දෙන්න.
- ටයරයේ මැද කොටස වර්ණ ගන්වන්න.
- කොළ ගුලි ඇලවීමට උපදෙස් දෙන්න.

<u>තවදුරටත් ඉගෙනුම</u>

කළු බ්‍රොවින් පොතක් භාවිතා කර කොළ ඉරා ගුලි කර විවිධ නිර්මාණ ඇලවීමට අවස්ථාව දෙන්න.

# දුවේ, පුතේ, කොළ අලවා ටයරය හැඩ කරමු.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 10 කේක් එකක් අයිසින් කරමු.

## ඉගෙනුම් ඵල

- දරුවාට අළුත් නිර්මාණ කිරීමේ අවස්ථාවක් උදාවෙයි
- සියුම් මාංශ පේශී වර්ධනය වේ.
- හැඩතල පිළිබඳ අවබෝධය ලබා ගනී.
- නිර්මාණය තුළින් සතුටක් ලබයි.










Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- දරුවා තමන් කැමති කේක් එකක් තෝරා ගෙන ඇඳීමට අවස්ථාව දෙන්න.
- ක්‍රේප් සහ A4, සවි කොළ ආදිය ලබා දෙන්න.
- ඇලවීමට උපදෙස් දෙන්න.

# දුවේ, පුතේ, කැමති කේක් එකක් ඇඳ, අයිසින් කරන්න

Not For Sale - CMSP

..............................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 11 කුරුල්ලා හැඩ කරමු.

## ඉගෙනුම් ඵල

- පරිසර අත්දැකීම් ලබා ගනියි.
- පිහාටුවල විවිධතා හඳුනා ගනියි.
- ඇස, අත සමායෝජනය වෙයි.
- පරිසර ගවේෂණයට හුරු වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- දරුවා පරිසරයට රැගෙන යන්න.
- කුරුළු පිහාටු ඇත්දැයි සොයා බැලීමට උපදෙස් දෙන්න. (පරිසරයේ පිහාටු නොමැති නම් ඒ සඳහා පෙර සූදානමක් ගුරුතුමිය සකස් කර ගත යුතුය)
- අහුලාගත් පිහාටු ගෙනවිත් කුරුල්ලා ඇලවීමට උපදෙස් ලබා දෙන්න.

තවදුරටත් ඉගෙනුම

මැටි වලින්, ක්ලේ වලින් සාදන ලද කුරුල්ලන් පිහාටු ගසා සැරසීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න

# කුරුල්ලාගේ පිහාටු අලවා හැඩ කරමු.



Not For Sale - CMSP


..............................................


ගුරුතුමියගේ අත්සන හා දිනය

## 12 කොළ රවුමට ඉරා පනුවා හැඩ කරමු.

### ඉගෙනුම් ඵල

- සියුම් මාංශ පේශි වර්ධනය වේ.
- වින්දනාත්මක ක්‍රියාකාරකමකින් සතුටක් ලබයි.
- ඇස, අත සමායෝජනය වේ.
- කොටුව පිළිබඳව හා රවුම පිළිබඳ ගණිත සංකල්ප සාධනය වේ.






Not For Sale - CMSP

### ගුරුතුමියට උපදෙස්

- කොළ කෑලි කොටුවට (සමචතුරස්‍රාකාරව) ඉරීමට දරුවාට උපදෙස් ලබා දෙන්න.
- එම කොළ කැබැල්ල හතරට නවන්න උපදෙස් දෙන්න.
- නවාගත් කොළය රවුමක් සිටින සේ අතින් ඉරා ගන්න උපදෙස් ලබා දෙන්න.
- ඇලවීමට උපදෙස් දෙන්න.

# කොළ රවුමට ඉරා පනුවා හැඩ කරමු.




Not For Sale - CMSP

..............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

## 13 ඉර මාමා සරසමු.

### ඉගෙනුම් ඵල

- ඇඟිලි තුඩු වර්ධනයට අවස්ථාව ලැබේ.
- ඇඟිලි තුඩු හැසිරවීමේ කුසලතාවය වර්ධනය වේ.
- විශාල මාංශ පේශි වර්ධනය සිදු වේ. (අත ක්‍රියාත්මක වීම තුළින්)




Not For Sale - CMSP

### ගුරුතුමියට උපදෙස්

- ක්ලේ ගුලියක් තබා ඇඟිල්ලෙන් ඉර දිගේ ඇඳීමට උපදෙස් දෙන්න.

# ඉර මාමා සරසමු.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 14 ගසක් හදමු.

**ඉගෙනුම් ඵල**

- පරිසරය ගවේෂණය කරයි.
- ගසක් නිර්මාණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය පරිසරයෙන් සොයයි.
- ඇස, අත සමායෝජනය වේ.
- නිර්මාණශීලිත්වය ගොඩනැගේ.



Not For Sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- ගසක් සඳහා ගැලපෙන දිගටි හැඩයේ කොළ වර්ග, උදා : ගොයම් කොළ, බට කොළ, දිරා ගිය හැඩ කෝටු, මල් වර්ග ආදිය ගෙන ගසක් සකසන්න උපදෙස් ලබා දෙන්න.

# කොළ හා මල් වලින් ගසක් හදමු.

Not For Sale - CMSP

.............................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

15

# අත් ගසක් ගොඩ නගමු.

## ඉගෙනුම් ඵල

- ඇඟිලි තුඩු වර්ධනය වේ.
- දළ මාංශ පේශි වර්ධනය වේ. (ඇඳීම තුළින්)
- විවිධ වර්ණ හඳුනා ගනී.
- වින්දනීය අවස්ථාවක් උදා වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- දරුවාගේ අත මැණික් කටුවට අඟල් 2 ක් පමණ දිගට අත්ල සීල් ගසන්න.
- ඒ සඳහා ස්වභාවික වර්ණ යොදා ගන්න.
- ගහේ ඉහළ කොටස සඳහා විවිධ වර්ණයේ ක්ලේ භාවිතා කරමින් ඇඟිලි තුඩු වලින් රැලි ආකාරයට අඳින්න.
- පන්චර් ඩොට් වලින් හැඩ කර ගන්න.
- මෙවැනි නිර්මාණ ක්‍රියාකාරකම් පන්තියේදී සිදු කිරීමට උනන්දු කරවන්න.

# අත් ගසක් හදමු.


Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 16 ගෙතීම - කඩදාසි නයෙක් හදමු.

## ඉගෙනුම් ඵල

- ඇස, අත උපයෝගි කරගෙන ගෙතීමට හුරු වේ.
- චිත්ත ඒකාග්‍රතාවය ඇති වේ.
- නිර්මාණශීලිත්වයට ඉඩ සැලසේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- A 4 කොළ වලින් අඟල් $1\frac{1}{2}$ ක පටි ලබා දෙන්න.
- අඟල් $\frac{1}{4}$ ප්‍රමාණයට රැලි ක්‍රමයට (සිග් සැග් ක්‍රමයට) නැමීමට උපදෙස් දෙන්න.

තවදුරටත් ඉගෙනුම.

- ගොක් කොළ නයා, රූම් පෙත්ත, ඔරලෝසුව සෑදීමට යොමු කරන්න.

# නයා සාදා අලවමු.

Not For Sale - CMSP

.....................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 17 බබාට කොණ්ඩයක් ගොතමු.

## ඉගෙනුම් ඵල

- සියුම් මාංශ පේශි වර්ධනය වේ.
- දෙඅත් එකසේ ක්‍රියාත්මක කිරීමට හුරුව ලබයි.
- ඇස, අත සමායෝජනය වේ.
- ස්වාධීනත්වය ගොඩනැගේ.
- නිර්මාණශීලිත්වය දියුණු වේ.
- වර්ණ පිළිබඳ අවබෝධය ලබා ගනී.



## ගුරුතුමියට උපදෙස්

- විවිධ වර්ණ රෙදි පටි 06 ක් ලබා දෙන්න.
- කොණ්ඩය සේ ගෙතීමට අවස්ථාව දෙන්න.
- කොණ්ඩය ඇලවීමට උපදෙස් දෙන්න.

Not For Sale - CMSP

# බබාට කොණ්ඩය ගොතමු.



Not For Sale - CMSP

..............................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 18 ඇසිරීම - ලියුම් කවරයට ලියුමක් දමමු.

## ඉගෙනුම් ඵල

- පිළිවෙල ඉගෙන ගනියි.
- ඉවසීම ප්‍රගුණ වේ.
- ඇස, අත සමායෝජනය වේ.
- මනෝචාලක ඉගෙනුම් අවස්ථාවක් උදාවෙයි.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- ලියුම් කවරයක් සකස් කරන්න.
- එය පොතේ අලවන්න.
- විවිධ ප්‍රමාණයේ ලියුම් ලෙස, කොළ නැමීමට උපදෙස් ලබා දෙන්න.
- ක්‍රමානුකූලව කවරයට ලියුම් ඇසිරීමට උදව් කරන්න.

# ලියුම් කවරයට අපි ලියුමක් දමමු.

Not For Sale - CMSP

..............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

**ආදරණීය දෙමාපියනි,**

ඔබේ ආදර පුංචි පුතා, දුව පෙර පාසලේ පළමු වාරයේ දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් අංක 01-18 දක්වා හොඳින් නිරීක්ෂණය කරන්න.
මේ වන විට පුතා, දුව ලබා ඇති ඉගෙනුම් ඵල පිළිබඳව අවබෝධයක් ලබා ගන්න.
මේ සියල්ල පිළිබඳව ඔබගේ අදහස් හා යෝජනා පහත සඳහන් කිරීමට කාරුණික වන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

| | | |
|---|---|---|
| ..................................... | ..................................... | ..................................... |
| මව/පියා/භාරකරුගේ නම | ගුරුතුමියගේ නම | ව්‍යාපෘති නිලධාරීගේ නම (නොවිධිමත් අධ්‍යාපන) |
| ..................................... | ..................................... | ..................................... |
| අත්සන හා දිනය | අත්සන හා දිනය | අත්සන හා දිනය |

## පළමු වාරය අවසානය

# දෙවන වාරය ඇරඹුම



Not For Sale - CMSP

# 19 නිදහසේ අපි අඳිමු.

## ඉගෙනුම් ඵල

- පාට භාවිතා කරමින් ස්වාධීන නිර්මාණයක් කරයි.
- නිදහස් චින්තනයට මග විවර කරයි.
- පෙර ලිවීම අරඹයි.

## ගුරුතුමියට උපදෙස්

- පැස්ටල් නිදහසේ දරුවා කැමති දෙයක් ඇඳීමට ඉඩ දෙන්න.
- ඒ පිළිබඳ දරුවා සමග සාකච්ඡා කරන්න.
- දරුවා පළමුව නිදහසේ ඇඳි චිත්‍රය (පිටු අංක 03 හි කුරුටු චිත්‍රය) හා මෙම චිත්‍රය අතර ඇති වෙනස තුළින් දරුවාගේ දියුණුව පිළිබඳව ඔබ හඳුනා ගන්න.)

## දුවේ, පුතේ දැන් අපි කැමති දෙයක් අඳිමු.

Not For Sale - CMSP

..........................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

## 20 නැමීම - සතෙකුගේ මුහුණ හදමු.


### ඉගෙනුම් ඵල

- නැමීමේ කුසලතාවය දියුණු වෙයි.
- මුහුණක අවයව ස්ථානගත කරයි.
- හැඩතල පිළිබඳ අවබෝධය ලබයි.
- වින්දනීය ඉගෙනුම් අවස්ථාවක් උදා වෙයි.

### ගුරුතුමියට උපදෙස්

- හරි හතරැස් කඩදාසියක් ගන්න.
- ත්‍රිකෝණයක් හදන්න.
- ත්‍රිකෝණයේ මුළු දෙක උඩට නමන්න.
- ඇස, නාසය, කට අඳින්න.

අලවා, මුහුණු කුමන සතාගේ දැයි නම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.




## නැමීම - අපි දැන් සතා හදමු.

### ඉගෙනුම් ඵල

- නැමීමේ හැකියාව තවදුරටත් වර්ධනය වෙයි.
- වින්දනීය ඉගෙනුම් අවස්ථාවක් උදා වෙයි.
- කඩදාසි කොළ වලින් නිර්මාණ කළ හැකි බව දැන ගනී.
- වින්දනීය ඉගෙනුම් අවස්ථාවක් උදා වෙයි.

### ගුරුතුමියට උපදෙස්

- A4 හෝ හරි හතරැස් කොළයක් ගන්න.
- ත්‍රිකෝණයක් හදන්න.
- සතෙකු නිර්මාණය කර හඳුනා ගෙන නම් කරන්න.



Not For Sale - CMSP

## අපි හදපු සතාගේ මුහුණ අලවමු.

.......................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

## අපි දැන් සතා අලවමු.

Not For Sale - CMSP

.......................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 21 අයිස් ක්‍රීම් එකක් හදමු.

## ඉගෙනුම් ඵල

- පරිසර ගවේෂණයට යොමු වේ.
- වින්දනීය අවස්ථාවක් උදා වේ.
- සියුම් මාංශ පේශි වර්ධනය වේ.
- ඇලවීමේ කුසලතාවය දියුණු වේ.



Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- A4 කොළයකින් ගොටුවක් සාදා ගන්න.
- කඩදාසි ගොටුවේ ඉහළ කෙළවර අයිස් ක්‍රීම් කෝන් එකක හැඩයට ආකාරයට කපා ගන්න.
- සුදු පැඩින් පුරවා ගන්න.
- පරිසරය ගවේෂණය කර සොයා ගන්නා ලද (ප්‍රදේශයට ආවේණික ගෙඩි වර්ග, ගඳපාන මල්, එරමිණියා ගෙඩි ආදිය යොදාගෙන සරසන්න. (දරුවන්ට විෂ නොවන දේ භාවිතා කරන්න)
- පන්චර් ඩොට් හෝ පාට ක්ලේ බෝල තබන්න.

# 22 පෙර ලිවීම.

**ඉගෙනුම් ඵල**

- ඇස, අත සමායෝජනය වෙයි.
- ඇස, අත වමේ සිට දකුණට ගෙන යාමට හුරු වේ.
- පෙර ලිවීමේ කුසලතා ආරම්භ කරයි.

**ගුරුතුමියට උපදෙස්**


- පාට කූරක් දී මකුළුවාට පාර අඳින්න.
- වමේ සිට දකුණට අත ගෙන යාමට හුරු කරන්න.
- තව දුරටත් මෙවැනි අභ්‍යාසවල යොදවන්න.

උදා : හාවාට කැරට් අලය ....................

සමනළයාට මල ............................

දරුවාට පාසල ............................

## මකුළුවාට ගෙදර සොයමු.



Not For Sale - CMSP

..............................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 23 වැස්ස වහිනවා

**ඉගෙනුම් ඵල**

- පෙර ලිවීමේ කුසලතා තවදුරටත් දියුණු වේ.
- වින්දනාත්මක ඉගෙනුම් අවස්ථාවන් උදා වේ.
- පරිසර පිළිබඳව අවබෝධය ලබා ගනියි.
- ඉහළ සිට පහළට අත සහ ඇස ගෙන යාමේ කුසලතා ලබයි.

**ගුරුතුමියට උපදෙස්**

- වළාකුළු සහ ඉර පාට කිරීමට සළස්වන්න.
- වැහි බිංදු ඉහළ සිට පහළට තවත් ඇඳීමට උපදෙස් දෙන්න.
- ගඟක් සේ වතුර ගලායන ලෙස පාට කිරීමට උපදෙස් දෙන්න.



Not For Sale - CMSB




..................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 24 භාවාට පාර කියන්න.

**ඉගෙනුම් ඵල**

- පෙර ලිවීමේ කුසලතා වර්ධනය වේ.
- වමේ සිට දකුණට අත ගෙන යාමට හුරුවේ.
- අත හැසිරවීමට ඉගෙන ගනියි.

**ගුරුතුමියට උපදෙස්**

- වමේ සිට දකුණට රූපයේ ආකාරයට පාර ඇඳීමට පැන්සල ලබා දෙන්න.
- ස්වාධීනව දරුවාට ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.



Not For Sale - CMSP

.............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය


# 25 අපි ඔරු පදිමු.

**ඉගෙනුම් ඵල**

- හැඩතල ඇඳීමට හුරුවක් ලබයි.
- අත හැසිරවීමේ කුසලතාවය වර්ධනය වේ.
- වමේ සිට දකුණට අත ගෙන යාමට හුරු වේ.

**ගුරුතුමියට උපදෙස්**

- වමේ සිට දකුණට රූපයේ ආකාරයට පාර ඇඳීමට පැන්සල ලබා දෙන්න.
- ස්වාධීනව දරුවාට ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- තව දුරටත් මෙවැනි අභ්‍යාසවල යොදවන්න.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 26 වැලි පිල්ලේ රටා අඳිමු.

**ඉගෙනුම් ඵල**

- වැලි සමග අත ස්පර්ශවීම තුළින් ඇඟිලි තුඩුවල සංවේදී ස්නායු උත්තේජනය වේ.
- බුද්ධි වර්ධනයට සුදුසු ඉගෙනුම් අවස්ථාවක් උදා වේ.
- සෞන්දර්යාත්මක කුසලතා වර්ධනය වේ.

**ගුරුතුමියට උපදෙස්**

- A 4 ප්‍රමාණයේ අඟලක ඝනකම ඇති ලෑලි පෙට්ටියක් සකසා ගන්න.
- වැලි පිල්ල සකසා ගන්න. (එක් දරුවෙකුට එක වැලි පිල්ල බැගින් සැකසීම වඩාත් උචිත වේ)
- පහත පරිදි විවිධ රටා මතුවන ලෙස වැලිපිල්ලේ ඇඳීමට යොමු කරන්න.
- වැලි පිල්ලේ අඳින ලද රටා පොතේ ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.



## නිදහසේ රටා අඳිමු.

Not For Sale - CMSP

..........................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 27 රූපය බලා කතාවක් ගොඩ නගමු

**ඉගෙනුම් ඵල**

- පෙර කියවීම සඳහා හුරුවක් ලබයි.
- කථන හැකියාව වර්ධනය වේ.
- දෘෂ්ටි විභේදනය සිදුවේ.
- චින්තන ශක්තිය වර්ධනය වේ.

**ගුරුතුමියට උපදෙස්**

- චිත්‍රය පිළිබඳ දරුවාගේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා සෑම විටම දරුවාට අවස්ථාව ලබා දෙන්න.
- චිත්‍රය පිළිබඳ දරුවාගෙන් ප්‍රශ්න අසන්න
- පෙර කියවීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා දරුවාට උචිත මෙවැනි චිත්‍ර පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.




Not For Sale - CMSP

# කැමති චිත්‍රයක් අඳිමු.

Not For Sale - CMSP

.......................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 28 පෙර කියවීම

## ඉගෙනුම් ඵල

- වමේ සිට දකුණට ඇස ගෙන යාමට හුරු වේ.
- රූප බලා කතාන්දරය අනුපිළිවෙලින් ගොඩනැගීමේ කුසලතාවය ඇති වේ.
- නිදහස් චින්තනයට මං සැළසේ.
- නිර්මාණශීලිත්වය වර්ධනය වේ.
- තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබේ.
- යහ පුරුදු ඇති වේ.




Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- කතාන්දරය කියන අවස්ථාවේදී ගුරුතුමිය හොඳින් දරුවාට සවන් දිය යුතුයි.
- අවාචික සන්නිවේදනය ගුරුතුමිය තුළින් ඉස්මතු විය යුතුයි.
- කතාන්දරයේ ආරම්භයේ සිට අවසානය දක්වා කතාව පැවසීමට දරුවාට අවස්ථාව ලබා දෙන්න.

## 29 පෙර කියවීම

**වමේ සිට දකුණට කතාන්දරයක් ගොඩ නඟමු.**




Not for Sale - CMSP

## 30 පෙර කියවීම.

පුංචි පුංචි කුකුළු පැටව්
හරි ලස්සන කුකුළු පැටව්
අම්මා වගේ නටන පැටව්
කෑම සොයයි කුකුළු පැටව්

මෙන්න මෙන්න රස කෑමක්
කවුද එන්නෙ කන්න එන්නෙ
එන්න එන්න ගන්න ගන්න
බෙදා ගනිමු අපි හැමෝම



Not For Sale - CMSP

**ඉගෙනුම් ඵල**

- පෙර කියවීමේ කුසලතාවය ලබයි.
- ගීයක් රස විඳීමට අවස්ථාව උදා වේ.
- නිදහස් චින්තනයට අවස්ථාව උදාවේ.
- නිර්මාණශීලිත්වය වර්ධනය වේ.
- ප්‍රකාශනයට අවස්ථාව ලැබෙයි.

**ගුරුතුමියට උපදෙස්**

- දරුවන් සමග ගීතය තාලයට ගයන්න.
- රූප කියවීමට අවස්ථාව ලබා දෙන්න.


# 31 පෙර කියවීම

**ඉගෙනුම් ඵල**

- පෙර කියවීමේ කුසලතාවය ලබයි.
- වින්දනයක් ලැබේ.
- යහපුරුදු වර්ධනය වේ.
- චිත්තවේග සංවර්ධනය වේ.


**ගුරුතුමියට උපදෙස්**

- දරුවන්ට පින්තූර බලා කතාව ගොඩනගන්නට උපදෙස් දෙන්න.




Not For Sale - CMSF

## ජම්බු පොකුර







ආදරණීය දෙමාපියනි,

ඔබේ ආදර පුංචි පුතා, දුව පෙර පාසලේ දෙවන වාරයේ දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් අංක 19-31 දක්වා හොඳින් නිරීක්ෂණය කරන්න.

මේ වන විට පුතා, දුව ලබා ඇති ඉගෙනුම් ඵල පිළිබඳව අවබෝධයක් ලබා ගන්න.

මේ සියල්ල පිළිබඳව ඔබගේ අදහස් හා යෝජනා පහත සඳහන් කිරීමට කාරුණික වන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

| | | |
|---|---|---|
| ........................................ | ........................................ | ........................................ |
| මව/පියා/භාරකරුගේ නම | ගුරුතුමියගේ නම | ව්‍යාපෘති නිලධාරී නම ( නොවිධිමත් අධ්‍යාපන) |
| ........................................ | ........................................ | ........................................ |
| අත්සන හා දිනය | අත්සන හා දිනය | අත්සන හා දිනය |

## දෙවන වාරය අවසානය

# තෙවන වාරය ඇරඹුම



Not For Sale - CMSP

# 32 ගැලපෙන සෙවනැලි යා කරන්න.

**ඉගෙනුම් ඵල**

- පෙර ලිවීමේ කුසලතාවය ලබයි.
- පැන්සල භාවිතයට හුරු වේ.
- ඇස, අත සමායෝජනය වේ.

**ගුරුතුමියට උපදෙස්**

- යා කිරීම සඳහා පැන්සල ලබාදෙන්න.
- අභ්‍යාසය නිම වූ පසු අගය කරන්න.

## ගැලපෙන සෙවනැලි යා කරන්න.



Not For Sale - CMSP

....................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 33 ගැලපෙන ලෙස යා කරන්න.

**ඉගෙනුම් ඵල**

- පෙර ලිවීමේ කුසලතාවය ලබයි.
- දෘෂ්ටි විභේදනයට අවස්ථාවක් ලැබේ.
- සංකල්ප හඳුනා ගනී.
- ඇස, අත සමායෝජනය වේ.

**ගුරුතුමියට උපදෙස්**

- යා කිරීම සඳහා පැන්සල ලබාදෙන්න.
- අභ්‍යාසය නිම වූ පසු අගය කරන්න.



Not For Sale - CMSP

..............................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 34 උසම රූපය රවුම් කරමු.

**ඉගෙනුම් ඵල**

- උස, මිටි සංකල්පය හඳුනා ගනී.
- වින්දනයක් ලබයි.

**ගුරුතුමියට උපදෙස්**

- උසම රූපය කැමති පාටකින් රවුම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.



Not For Sale - CMSP

..............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 35 මිටි ළමයා තෝරමු.

## ඉගෙනුම් ඵල

- උස, මිටි සංකල්පය හඳුනා ගනී.
- වින්දනයක් ලබයි.

## ගුරුතුමියට උපදෙස්

- මිටි ළමයා රවුම් කිරීමට පාට කූරු ලබා දෙන්න
- සංකල්පය තව දුරටත් සාධනය වීම සඳහා පන්තියේ උස හා මිටි ළමයින් සහ පරිසරයේ උස මිටි ද්‍රව්‍ය භාවිතා කරමින් උස මිටි සංකල්ප දරුවාට දැනෙන ආකාරයට තේරුම් කර දෙන්





Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දින


# 36 පොඩිම කළය පාට කරමු.

**ඉගෙනුම් ඵල**

- ලොකු, පොඩි සංකල්පය හඳුනා ගනී.
- වින්දනයක් ලබයි.

**ගුරුතුමියට උපදෙස්**

- පොඩිම කළය පාට කිරීමට අවශ්‍ය පාට සපයන්න.



Not For Sale - CMSP

....................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 37 මැද සිටින ළමයා රවුම් කරමු.

**ඉගෙනුම් ඵල**

- ස්ථානය පිළිබඳ අවබෝධයක් ලබයි.
- වින්දනයක් ලබයි.

**ගුරුතුමියට උපදෙස්**

- අසර නැමති ගණිත සංකල්පය තහවුරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම ඉගෙනුම තවදුරටත් තහවුරු කිරීමට ක්‍රියාකාරකම්වල යොදවන්න.

Not For Sale - CMSP



..............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 38 උඩ ළමයා රවුම් කරන්න.

## ඉගෙනුම් ඵල

- ස්ථානගතවීම පිළිබඳ සංකල්පය හඳුනා ගනී.
- තර්කන ශක්තිය දියුණු වේ.

## ගුරුතුමියට උපදෙස්

- රවුම ඇඳීමට පාට ලබා දෙන්න.
- දරුවන් සමග චිත්‍රය පිළිබඳ සාකච්ඡා කරන්න.
- මෙම සංකල්පය තවදුරටත් සංවර්ධනය සඳහා මෙවැනි ක්‍රියාකාරකම්වල යොදවන්න. (කතන්දර, ක්‍රීඩා වැනි)



Not For Sale - CMSP


.....................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 39 හැඩය අනුව තෝරා අලවමු.

## ඉගෙනුම් ඵල

- හැඩය අනුව තේරීමේ කුසලතාවය දියුණු කර ගනියි.
- ජීවන කුසලතා දියුණු වේ.
- නිවැරදි තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වේ.
- වින්දනයක් ලබයි.




Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- ඉහත රූපයේ පරිදි වෙනම වර්ණවලින් යුත් කොළවල හැඩතල කපා ගන්න.
- එකී හැඩතල දරුවාට ලබා දෙන්න.
- අදාල කොටුවල ඇලවීමට යොමු කරන්න.

# හැඩය අනුව තෝරා අලවමු.




Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

## 40 ප්‍රමාණය අනුව තෝරමු.

**ඉගෙනුම් ඵල**

- ප්‍රමාණය අනුව තේරීම ඉගෙන ගනී.
- විශ්ලේෂණ හැකියාව දියුණු වේ.





Not For Sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- ඉහත රූපයේ පරිදි හැඩය එකම වර්ණයෙන් වෙනත් කොළයක් භාවිතා කර කපා ගන්න.
- එකී හැඩ දරුවාට ලබා දෙන්න.
- අදාල කොටුවල ඇලවීමට යොමු කරන්න.

# ප්‍රමාණය අනුව තෝරමු.






Not For Sale - CMSP

..........................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 41 දේදුන්නේ නැගලා ලෝකෙ වටේ අපි යමු යාළු

## ඉගෙනුම් ඵල (ඇගයීම සඳහා)

- සියුම් මාංශ පේශි වර්ධනයට අදාලව ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- මූලික වර්ණ හඳුනා ගනී.
- දේදුන්න පිළිබඳව සතුටින් අදහස් දක්වයි.
- නිර්මාණය සම්පූර්ණ වනතුරු ක්‍රියාකාරකමේ නිරත වෙයි.




Not For Sale - CMSP

## ගුරුතුමියට උපදෙස්

- දේදුන්නේ වර්ණ ඇති සවි කඩදාසි ගන්න.
- ගුලි කිරීමට අවස්ථාව දෙන්න.
- දේදුන්නේ හැඩයට අනුව ඇලවීමට උපදෙස් දෙන්න.
- අගය කරන්න.

# දේදුන්නේ නැගලා ලෝකෙ වටේ අපි යමු යාළු



Not For Sale - CMSP

..........................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 42 අපි හොඳ යාළුවෝ

**ඉගෙනුම් ඵල**

- වින්දනයක් ලබයි.
- සවන් දීමේ කුසලතාවය ලබයි.
- චිත්ත රූප මවා ගනී.
- අලුත් වචන ඉගෙන ගනී.
- කතන්දර ගොඩ නගයි.

**ගුරුතුමියට උපදෙස්**

- චිත්‍රය කියවීම සඳහා සෑම විටම දරුවාට අවස්ථාව දෙන්න.
- චිත්‍රය පිළිබඳ දරුවාගෙන් ප්‍රශ්න අසන්න.
- අකුරු වලින් කියවෙන කතන්දරය දරුවන්ට කියා දෙන්න පින්තූරය පෙන්වමින් (කතන්දර, ක්‍රීඩා වැනි)



වත්ත පහල කොස් ගහේ තිබුණා ලොකු මී වදයක්. වෙනද වගේම මී මැස්සන් කෑම සොයාගෙන උදෙන්ම ඉගිල ගියා. අනේ ඒත් එක මී මැස්සෙක් අතරමං වුනා. පියාඹගෙන, පියාඹගෙන ගියත් යාළුවො හමු වුනෙත්, කෑම හමු වුනෙත් නැහැ. තව තව ඈතට ඉගිල ගියා. මී මැස්සට හරිම මහන්සියි. වටපිට බැලුවා. මී මැස්සට හරිම සතුටුයි.



ඇයිද දන්නවද මී මැස්සට සතුටු ? එයා දැක්ක ලස්සන මලක්....

එයා ඉක්මණින් මලට ළංවුණා පැණි බොන්න. අනේ.... ඒ මලේ සමනළයෙක් පැණි බොනවනේ.





මී මැස්සට හරියට දුක හිතුණා... බඩගින්නත් වැඩි වුණා. මී මැස්සෙක් ඇවිදින් දුකින් බලන් ඉන්නවා මලේ සිටි සමනළයා දැක්කා. සමනළයා මොකද කළේ කියල දන්නවද ? මගේ බඩ හොඳටම පිරිලා. මී මැස්සට පැණි බොන්න ඉඩ දීලා සමනළයා පියඹලා ගියා. මී මැස්සා සතුටින් මල් පැණි බිව්වා. බඩ පිරුණා. මී මැස්සට හරිම සතුටුයි.



Not For Sale - CMSP

43

# කතන්දර පිටුව



සුදු පුතා අද අපි සත්තු වත්ත බලන්න යනවනේ... දැන් නැගිටින්න... හොඳ ළමයි උදෙන්ම නැගිටිනවනේ.. දත් මැදල, මූණ සෝදල ඉක්මණට අපි ලේස්ති වෙමු.



අපි යන්නෙ බස් එකෙන් නේද අම්මේ... ඔව් පුතා අපි දැන් පාරට යමු. පුතේ මේ කහ ඉරෙන් තමයි පාර මාරු වෙන්න ඕන.



අන්න අම්මේ.. බස් එකක් එනවා. අපි ඒකෙ යමු. පුතේ බස් එක නැවැත්තුවහම තමයි නගින්න ඕන. අම්මෙ අපි මෙතන වාඩි වෙමු.

පුතේ කවුළුවෙන් ඔළුව, අත එළියට දාන්න එපා. අන්න කොන්දොස්තර මාමා එනවා. ටිකට් එක අරගෙන මට දෙන්න. පුතා බස් එකෙන් බහිනකම් ටිකට් එක නැති කර ගන්න එපා.


පුතේ ඔයා ඉඳගෙන ඉන්න. මම නැගිටල අර ආච්චි අම්මට වාඩි වෙන්න ඉඩ දෙන්නම්.

ආ...... පුතේ... දැන් අපි බහින්නත් ළඟයි. සීනුව නාද කරහම බස් එක නතර කරාවි. .. අපි පරිස්සමින් බහිමු.

Not For Sale CMSP

# ඇගයීම සඳහා ක්‍රියාකාරකම්

## 44 රූපය මතු කර පාට කරන්න.



Not For Sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- තිත් යා කර රූපය මතු කර ගැනීමට උපදෙස් දෙන්න.
- එම රූපය පිළිබඳ අදහස් විමසන්න.
- පාට කිරීමට උපදෙස් ලබා දෙන්න.

.................................................
ගුරුතුමියගේ අත්සන හා දිනය


# 45 කාරයක් හදමු.

**ඉගෙනුම් ඵල (ඇගයීම සඳහා)**

- කොටස් දෙකක් ගැලපීමෙන් රූපයක් සකස් කරයි.
- සිතීමේ හැකියාව දියුණු වේ.
- වින්දනයක් ලබයි.

**ගුරුතුමියට උපදෙස්**

- පහත රූපයේ පරිදි වෙනත් කොළයක අඳින ලද කොටස් දෙකකට කැපූ කාරයේ කොටස් දෙක දරුවාට දෙන්න.
- එම රූපය පිළිබඳ අදහස් විමසන්න.
- අදාළ පිටුවේ කාරය ඇලවීමට අවස්ථාව දෙන්න.




Not For Sale - CMSP

.......................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 46 බැලූම මගේ ලස්සනයි.

**ඉගෙනුම් ඵල**

- ඇස, අත සමායෝජනය
- වින්දනයක් ලබන බව පෙනේ.
- සීමාව තුළ පාට කරයි.




Not For Sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- තමා කැමති වර්ණ භාවිතා කර, සීමාව තුළ පාට කිරීමට යොමු කරන්න.
- කුසලතා ලබා ඇත්නම් ඉහතින් දැක්වූ ඉගෙනුම් ඵල පෙන්වයි.

# බැලුම මගේ ලස්සනයි.



Not For Sale - CMSP

..............................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

## 47 නිල් අහසේ ඉර මාමා - රතු පාටින් බැස යනවා

**ඉගෙනුම් ඵල**

- ගීතයට අදාලව චිත්‍රයක් ඇඳීමේ හැකියාව පෙන්වයි.
- සවන් දීමේ කුසලතාවය පෙන්වයි.
- වින්දනය ලබන බව පෙන්වයි.

අහසයි මුහුදයි නිල් පාටයි
නංගිගෙ ගවුමත් නිල් පාටයි
ඉර මාමා දැන් රතු පාටයි
බලා ඉන්න මං හරි ආසයි

Not for sale - CMSP

**ගුරුතුමියට උපදෙස්**

- තාලයට ගීතය ගයන්න.
- කවියේ අර්ථය දරුවන්ට පැහැදිලි කර දෙන්න.
- චිත්‍රයට නගන්න අවස්ථාව ලබා දෙන්න.
- අගය කරන්න.



# නිල් අහසේ ඉර මාමා - රතු පාටින් බැස යනවා

Not For Sale - CMSP


..........................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 48 කජු පුහුලම් වාරෙ ඇවිල්ලා...

**ඉගෙනුම් ඵල (ඇගයීම සඳහා)**

- වින්දනයක් ලබන බව පෙනේ.
- සීමාව තුළ පාට කරයි.
- වර්ණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.




**ගුරුතුමියට උපදෙස්**

- අදාළ වර්ණ හඳුනා ගැනීමට අවස්ථාව දී සීමාව තුළ පාට කිරීමට යොමු කරන්න.
- කුසලතා ලබා ඇත්නම් ඉහතින් දැක්වූ ඉගෙනුම් ඵල පෙන්වයි.

Not For Sale - CMSP

# කජු පුහුලම් වාරෙ ඇවිල්ලා...



Not For Sale - CMSP

.........................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

## 49 මුල් රූපය බලා දෙවන රූපයේ අඩුපාඩු සම්පූර්ණ කරයි.


### ඉගෙනුම් ඵල (ඇගයීම සඳහා)

- රූප දෙස විමසිලිමත් ලෙස බලයි.
- දෙවන රූපයේ අඩුපාඩු හඳුනා ගනියි.
- දෙවන රූපය සම්පූර්ණ කිරීම තුළින් වින්දනයක්

### ගුරුතුමියට උපදෙස්

- පහත රූප විමසිලිමත්ව බැලීමට උපදෙස් දෙන්න.
- එම රූපය පිළිබඳ අදහස් විමසන්න.
- තනි, තනිව අඩුව සෙවීමට අවස්ථාව දෙන්න.






Not For Sale - CMSP

......................................................

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 50 වෙනස හඳුනා ගනිමු.

වෙනස් රූපය සොයන්න. වෙනසට හේතු විමසන්න.



Not For Sale - CMSP

ගුරුතුමියගේ අත්සන හා දිනය

# 51 යාළුවා සරසමු.

**ඉගෙනුම් ඵල**

- ගමනක් යාමට අවශ්‍ය දේ තෝරා ගනියි.
- ජීවන කුසලතා පිළිබඳ දරුවා අවබෝධ කර ගනියි.
- අදාල ඉන්ද්‍රියන් හඳුනාගෙන අවශ්‍ය උපකරණ යා කරයි.

**ගුරුතුමියට උපදෙස්**

- පහත රූප විමසිලිවත්ව බැලීමට උපදෙස් දෙන්න.
- අදාල රූප යා කිරීමට පැන්සල ලබා දෙන්න.


තවදුරටත් ඉගෙනුම

- රෙදි බෝනික්කෙක් කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.
- සැරසීම සඳහා අවශ්‍ය උපකරණ, කඩදාසි, ක්‍රේප් කොළ ආදී ... සුදුසු පරිදි ලබා දෙන්න.. සැරසීමෙන් අනතුරුව පහත ගීතය ගායනා කරමින් වින්දනයක් ලබා දෙන්න.

ලස්සන මගෙ යාළුවේ
අපි ඇඳුමක් අඳිමුද
අපි ගීයක් ගයමුද
අත්පුඩියක් ගහමුද
අපි නැටුමක් නටමුද
ලස්සන මගෙ යාළුවේ













Not For Sale - CMSP


## 52 ගැලපෙන රූපය යා කරමු.



Not For Sale - CMSP

..............................................
ගුරුතුමියගේ අත්සන හා දිනය

# 53 ළමයාගේ ගෙදරට යන පාර සොයමු.



Not For Sale - CMSP

දරුවාගේ නම : උපන් දිනය :

# ඇගයීම් වාර්තාව

| අනු අංකය | ළඟා වූ කුසලතා | ඉතා හොඳයි | හොඳයි | සතුටු දායකයි | සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|---|
| 01 | මූලික හසුරු කුසලතා සංවර්ධනය වී ඇත | | | | |
| 02 | සීමාවක් තුළ පාට කරයි. | | | | |
| 03 | මූලික ගණිත සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා ඇත | | | | |
| 04 | පින්තූර දෙස බලා කතාවක් ගොඩනගයි. | | | | |
| 05 | ප්‍රධාන වර්ණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | | | | |
| 06 | හොඳින් සවන්දෙයි. | | | | |
| 07 | වෙනස්කම් හඳුනාගනියි. | | | | |
| 08 | දෙන ලද ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි. | | | | |
| 09 | උදව් නොමැතිව ක්‍රියාකාරකම්වල යෙදෙයි . | | | | |
| 10 | සම වයස් කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කරයි. | | | | |
| 11 | තම අදහස් ප්‍රකාශ කරයි. | | | | |
| 12 | දෙනු ලබන උපදෙස් පිළිගනියි. | | | | |
| 13 | සතුටින් ක්‍රියාකාරකම්වල යෙදෙයි. | | | | |
| 14 | උපකරණ නිවරැදිව අල්ලයි, භාවිතා කරයි. | | | | |
| 15 | තමාට සමීප දේ හඳුනාගෙන නම් කරයි. | | | | |
| 16 | පරිසර ගවේෂණයට කැමැත්තක් දක්වයි. | | | | |
| 17 | ක්‍රියාකාරකම් වල අවසානය දක්වා නිරතවෙයි. | | | | |
| 18 | සුහදව කටයුතු කරමින් ආචාරශීලීව හැසිරෙයි. | | | | |
| 19 | ක්‍රියාකාරකම අවසානයේ ද්‍රව්‍ය නිසි තැන අසුරයි. | | | | |
| 20 | ක්‍රියාකාරකම්වල යෙදෙමින් පොත පිරිසිදුව තබාගනී | | | | |

Not For Sale - CMSP

..............................................
පෙර පාසල් ගුරුතුමියගේ නම

..............................................
ව්‍යාපෘති නිලධාරී නම (නොවිධිමත් අධ්‍යාපන)

..............................................
අත්සන හා දිනය

..............................................
අත්සන හා දිනය

# පෙර පාසල් සඳහා

# වැඩ පොත



දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය **ෂාන් විජයලාල් ද සිල්වා** මැතිතුමාගෙන්

දකුණේ දූ දරුවන්ට පිදෙන තිළිණයකි

Not For Sale - CMSR

print @ PrintHouse 0777 9000 25